ශබ්ද පූජා

උපන් දින සාද, පනහේ සාද, මඟුල් තුලා ආදී මේ කොයි සාදයේදීත් අපට අත්විඳින්නට වෙන පොදු අපහසුතාවයක් ගැනයි මේ අවනඩුව. හිතවතුනි, ඔබ කොයි කවුරුත් සත්කාරයන් කරන්නේ සුහද සිතින් බව ඇත්ත. ඊට සංගීතයද මුසු කරන්නේ අපේ සතුට වැඩි කරන්න තමයි. ඒත් බොහෝවිට මේ සංගීතය සපයන අපේ සහෘදයන් තේරුම් නොගන්න කාරණයක් තමයි ඔබගේ සුමියුරු සංගීතයම ආරාධිතයන්ට කඩොර නාදයක් වන බව. සාදවලට මිනිසුන් පැමිණෙන්නේ කලකින් හමුවන මිතුරන් හමුවී සතුට බෙදා ගන්නයි. නව මිතුරන් හඳුනා ගමින් කාලය සතුටින් ගත කරන්නයි නේද? ඒත් මේ අතරට ඔබ සපයන සංගීතයේ ශබ්දය නිසා ඇතිවන අපහසුතාවය ගැන නම් කියලා වැඩක් නැහැ. **කොපමණ අපහසු ද කියනවා නම් යාබද ආසනයේ ඉන්න කෙනා එක්කකවත් බෙරිහන් දෙන්නෙ නැතිව**

කතා කරන්න බැහැ. සාදයකට සංගීතය සැපයීමේදී ශබ්දය තීව්‍ර කරන්නේ සාදය ආරම්භයේදීම නොව සාදයේ උච්ච අවස්ථාවන් වලදී බව තේරුම් නොගන්නේ ඇයි

මේක පුංචි ඉල්ලීමක් කරුණාකර මේ ගැන සැලකිලිමත් වෙන්න. පැමිණෙන අමුත්තන්ගේ අපහසුතාවය ගැන හා ඔවුන්ගේ දෙසවන් ගැනද සිතන්න. ඔබේ සංගීතය ශබ්ද පූජාවක් බවට පත් කර ගන්න එපා. සාදයක අරමුණ සංගීතය පමණක් නෙවෙයි.

නියමුවා සහ නංගි

විප්ලවවාදී දේශපාලන පක්ෂ නායකයකු ගණිකා වෘත්තිය දෙස බලන කෝණයත් සාමාන්‍ය ජනයා බලන කෝණයත් අතර විශාල පරතරයක් තිබෙනවා. හුදී ජනයා කාමුකව දකින දේ දෙස විප්ලවවාදියෙකු බලන්නේ මානව දයාවෙන් යුතුවයි. ඒත් ගනිකාව හා පිංපියෙකු අතර පරතරය නම් විශාලයි. ඒකට ලිංග බේදයක් නැහැ. එතැන ඇත්තේ යෙදීම හා යෙදවීම අතර ප්‍රශ්නයක්. නායක සහෝදරයාගේ නංගි තවම පොලීසියට අහුවෙලා නැති නිසා ඈ වරදකරුවෙක් නොවෙයි තාම. ඒක පරණ බයිලාවක්. ගැටළුව ඒක නොවෙයි. ලෙයින් කඳුලින් දහදියෙන් ගොඩ නැගුණු පක්ෂයක නායකයාගේ සහෝදරිය පක්ෂයේම ජේෂ්ඨ නායකයාගේ ආසනයේම ගනිකා මඩමක් පවත්වාගෙන යාම පක්ෂයට ගැටළුවක් නොවීම කොයිතරම් දුරට සදාචාරාත්මකද? නංගිත් එක්ක සම්බන්ධයක් නැති බව සත්‍යයක්. ඒත් ජනතාව කතා කරන්නේ කුරේලා ගැන නොවෙයි. සිද්ධියෙන් පසු ඒ පිළිබඳව නායක සොහෝදරයා මාධ්‍යවලට කරන ප්‍රකාශ ගැන. ජ.වි.පෙ. වාගේ පක්ෂයකට කොයිතරම් දුරට ගැලපෙනවද යන්නත් ප්‍රශ්නයක්. සහෝදරත්වය අපිත් ඉහලින්ම අගයනවා. ඒත් ඔය පක්ෂයේ එදා නම් හිටියේ බොහෝවිට තමන්ගේ පෞද්ගලිකත්වයට වඩා පක්ෂය ඉදිරියෙන් තිබපු මිනිස්සුයි.

චෞර රැජින

වික්ටර් අයිවන් සහ ඔහුගේ මාධ්‍ය භාවිතාව පිළිබඳව අපට කොපමණ ගැටළු තිබුණත් මෙතෙක් ශ්‍රී ලංකාව බිහිකල නිර්භීතම මාධ්‍යවේදියෙකු ලෙස මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ඔහු පත්වී හමාරයි. නිදහස ලැබූ දා සිට තව්ටු මාරු ක්‍රමයට මේ රට පාලනය කල නායකවරුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව හා ජනතාවගේ බුහුමනට ලක්වුන නායිකාවකගේ ජීවිතයේ ඇතුල් පැත්ත ගැන කදිම විවරණයක් මෙහි සඳහන් වෙනවා. ආකර්ශනීය සිනහවකින් ජනතාව මුලා කරමින් ජනතාව රටේ සාරය තමන්ගේත් සහචරයින්ගේත් භුක්තියට ගනිමින් විරුද්ධවාදීන් ඝාතනය කරමින් කල කී දෑ අයිවන් මේ ග්‍රන්ථයෙන් හෙළිදරව් කරන්නේ අප සංත්‍රාසයට පත් කරමින්. චෞර රැජින ග්‍රන්ථය තුළ ඔහු විසින් හෙළිදරව් කරන දූෂණ, වංචා, අපරාධ වලට ඔහුත් යම් තාක්දුරට වගකිව යුතුයි. පමාවී හෝ ජනතාවට මේ සියළු දේ යම්තාක් දුරටවත් හෙළිදරව් කිරීම ගැන අප ඔහුට කෘතඥ විය යුතුයි. ප්‍රශ්නය ඇත්තේ අප රටේ ජනතාවට කොයිතරම් දුරට මේවා මතකයේ තිබේවිද යන්න ගැනයි. මෙපමණ දේ ඇස්පනා විටම ඔප්පු වී තිබියදීත් තවදුරටත් ඔවුන් පසුපස යමින් මේ රට නැවතත් උන්නම භාරදෙන්න වලිකන කොටසක් සිටීම සංවේගයට කරුණක් නොවෙයිද? කියවා බලන්න වටින පොතක්

සව්දියට පසු

සිංහල රේඩියෝවේ කලබලය ඉවරයි. ගැටළු ඇති නොවී බලය මාරු වීම සතුටට කරුණක්. එයට මඟපෑදු සුමිරට අපගේ තුති. කෙතරම් පහසුවෙන් කල හැකිව තිබූ දෙයක්ද මේ. පුදන කොටම කාපි යකා සේ මාසයකින් නව කණ්ඩායම විවේචනය කරන්න අපි සූදානම් වන්නේ නැහැ. ඒත් මේ දේ නම් කිව යුතුමයි. යුද්ධය හිඟන්නාගේ තුවාලය කර ගන්න එපා. හිටපු කට්ටිය කල කී දෑ එලෙසම පවත්වාගෙන යන්න නම් අලුත් කණ්ඩායමක් අවශ්‍ය වන්නේ නැහැ හොඳ රේඩියෝවක් නම් අළුත් විය යුතුයි. මේ ආකෘතිය වෙනස් විය යුතුමයි. එය සතියෙන් දෙකෙන් ශ්‍රාවකයාට දැනිය යුතුයි. යම් නවතාවයක් තිබුණත් එහි සිසු වර්ධනයක් විය යුතුමයි. කියන්න පහසුයි කරන්න අපහසුයි එයත් අප දන්නවා. කමක් නැහැ ඔබ තවම ළදරුවෙක් ඔහොම යං.

නන්දන සහෝදරයා

මේ ලියන මොහොත වෙනකං නන්දනගේ තීරණයට මගේ ඇත්තේ දැඩි ගෞරවයක්. තමන් වෙනුවෙන් හෝ ජනතාව වෙනුවෙන් හෝ කරන මොන දේශපාලනය තුළ වුවත් හදවතට එකඟ බවක් හා ගෞරවනීය බවක් තිබිය යුතුමයි. තමන් එකඟ නැත්නම් කාපු බතේ පහරන්නේ නොමැතිව නිශ්ශබ්ද වීම වැදගත් කමක්. නන්දනගේ නිහඬවීම විරුද්ධ මතවාදීන්ට දැඩි ආශ්වාදයක් ගෙන දුන්නත්, ඔහු පක්ෂ සාමාජිකත්වයේ රැඳී සිටීම ඔවුන්ගේ සතුට සීමා කරලා. මා දන්නා පානදුරේ නන්දන නම් පක්ෂයෙන් ගොඩ නැගුන මිනිසෙකුට වඩා පක්ෂය වෙනුවෙන් යුතුකම් ඉටුකල මිනිසෙක්. අප අතර යම් දුරස්ථවීමක් ඇත්නම් එයටද හේතුවී තිබුනේ පෞද්ගලික හිතවත්කම් වලට වඩා පක්ෂය මුල්කොට තැබීමයි. නන්දනගේ මහත්මා දේශපාලනය සුළුකොට තකන්නට ජ.වි.පෙ. සැරසේ නම් එය අපරාධයක්. පක්ෂය කෙසේ කුමන දේ කීවත් දැන් ඔවුන් යෙදෙන්නෙත් ධනපති ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේමයි. එවැනි තත්ත්වයක් තුල නන්දනගේ තර්කයන් වලංගු නොවන්නේ කොහොමද? ජ.වි.පෙ. යන්න තවත් එක් පක්ෂයක තත්ත්වයට ජනතාව තුල හැඟීමක් ඇති වන්නට ඉඩ දෙන්න එපා.

සංක්‍රමණිකයා

සිසිරගේ කුරුටු ගී

පුවත්පතේ ජ්‍යෙෂ්ඨ කර්තෘ වරියක වන සාගරිකා දිසානායක (ජයසිංහ) සිසිරගේ කුරුටු ගී පොත පිළිගත්තා ය.

සිසිර අතින් වරින් වර ලියවුණ ගී පද රචනා 90 ක් සිසිරගේ කුරුටු ගී පොතේ එයි. ඒ අතර ශ්‍රී ලංකාවේ අතිශය ජපත්‍රිය වූ ,මැද්දේ ගම් ගිය

සිසිරගේ කුරුටු ගී , සිසිර දිසානායක නම් වන ප්‍රතිභාපූර්ණ ගීත රචකයාගේ පළමු ගීත එකතුවයි. කොළඹ ගොඩගේ පොත් ප්‍රකාශකයන්ගේ ගීත සහ කාව්‍ය ග්‍රන්ථ ව්‍යාපෘතිය යටතේ එළි දැක්වුණ සිසිරගේ කුරුටු ගී පොත පසුගිය දා මෙල්බන් නිදි පැවැත්වුණ රෝහණ රන්සර ප්‍රසංගයේ දී වික්ටර් රත්නායක ශිල්පියාණන්ටත් රෝහණ වීරසිංහ සංගීතඥයන්ටත් දීපිකා ප්‍රියදර්ශනී ශිල්පිණියටත් සුනිල් ඒදිරිසිංහ ශිල්පියාටත් පිරි නැමුණි

"මගේ පොත මේ ප්‍රසංගයේදී දොරට වඩන්නට මට අවස්ථාව ලැබීම මට විශාල සතුටක්.." සිසිර පැවසුවේ ය.

"ගොඩගේ පොත් ව්‍යාපෘතියට අත් පිටපත් දෙදාහකටත් වඩා ලැබුණ බව මම දැනගත්තා.. ඒ අතරින් මගේ අති පිටපත ප්‍රකාශයට පත් කරක්කට තෝරා ගැනීම මට ලොකු ධෛර්යයක් ගෙන දුන්නා.. මගේ පොතේ පෙරවදන ලියා දුන්නේ රත්න ශ්‍රී විජේසිංහ වියතාණන්. ඔහුටත් මගේ කෘතවේදීත්වය පිළිතැන්වෙනවා.." සිසිර අපට පැවසුවේ ය.

සිසිරගේ කුරුටු ගී පොතේ පිටකවරය ද ඔහුගේම නිර්මාණයකි. මේ සඳහා පහන මාසිකයට වරින් වර ඔහු අඳින ලද සිතඳුවම් කීපයක් යොදා ගත් බව සිසිර පවසයි.

2005 දෙසැම්බර් 21 වන දින කෙළඹ මහජන පුස්තකාල ශාලාවේදී පැවැත්වුණ ගොඩගේ පොත් ව්‍යාපෘතියේ පොත් එළි දැක්වීමේ උළෙලේ දී සිසිර වෙනුවෙන් ඔහුගේ සොහොයුරිය වන සිළුමිණ මද්දුමයා, , හාදවෙවෙන්ට අවා තමයි, ,උඹෙ සිරික්කියට, , සඳ සාවි, වැනි ගීත කැපී පෙනෙයි.

"ජන ගීයේ රුව ගුණ ආත්ම කොට ගත් ගේය කාව්‍ය රචකයා" මැයෙන් පෙරවදන ලියන රත්න ශ්‍රී විජේසිංහ ශූරීන්ගේ මේ අදහස සිසිර ගේ හැකියාවන් පිළිබඳ හොඳම නිර්වචනයයි.

"ජන ගීයේ හා ජන කවියේ සම්පත් කෙරෙහි ආශක්තව ඒවා සීමා රැස් කරමින් ඉන් නිර්මාණාත්මක නව ගීතයක් නිමවීම වෙනුවෙන් වෙහෙසෙන සිසිර දිසානායක අතීත කාව්‍යය ඉක්මවා වර්තමානයට පා තබන විටත් අත්කර ගන්නා ජයග්‍රහණ රැසකි. ඔහුගේ ගීතයේ ආත්මය ජන සංස්කෘතිය වුව ද ඔහු එකී පටු පරාසයෙහිම රඳවා තැබිය යුතු නැත. කාලීන සමාජ අත්දැකීම් නිරූපනය කරනු සඳහාද ඔහු නිසැකවම සුදුසුකම් ලබා සිටින්නෙකි"

ඔබේ ශ්‍රී ලාංකික දන්ත වෛද්‍යවරයා

Dr Shahnaaz Ozeer
B.D.S. , Dip. Clin. Dent (Restorative) NZ
Dip. Clin. Dent (Oral Medicine) NZ

DENTIST

Facilities are also available for :
Mini implants
Whitening of teeth
Aesthetic dentistry
Preventive Care

1254 Plenty Road, Bundoora 3083
Tel : 03 9467 7760